**වීරකැටිය ප්‍රාදේශීය සභාව**
**හම්බන්තොට දිස්ත්‍රික්කය**
**-------------------------------**

## 1 මූල්‍ය ප්‍රකාශන
**----------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
**---------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 ජූනි 15 දිනද , ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 ජූනි 18 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 සැප්තැම්බර් 2 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 අහිතකර මතය
**----------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත්බව හේතුවෙන් 2014 දෙසැම්බර් 31 දිනට වීරකැටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
**--------------------------------------**

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
**-----------------------**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුල ස්ථාවර තැන්පත් ගිණුමක තිබූ රු.1,000,000 ක මුදල ආපසු ලබාගෙන තිබූ අතර එය ස්ථාවර තැන්පත් ගිණුම බැර කිරීම වෙනුවට වෙනත් ආදායම් ගිණුම බැරකර තිබුණි. වෙනත් ආදායම් ගිණුමට බැර වීම නිවැරදි කිරීම සඳහා තබා තිබූ ජර්නල් සටහන මගින් වෙනත් ආදායම් ගිණුමට හර වියයුතු රු.1,000,000 ක මුදල සදොස් ලෙස වෙනත් උපයෝගී ගිණුම් දෙකකට හරකර තිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී උපලේඛනයන්හි සඳහන් ශේෂයන් හා ලෙජර් ගිණුම්වල ශේෂයන් අතර ඇති වූ රු. 10,764,352 ක නොසැසඳීම් ඉවත් කිරීම සඳහා එසේ නොසැසඳීම් වලට හේතු වූ කරුණු පරීක්ෂා කිරීමකින් තොරව ජර්නල් සටහන් පහක් මගින් රු. 1,225,567 ක මුදලක් බැර හා රු. 9,538,785 ක මුදලක් සමුච්චිත අරමුදලට හර කර තිබුණි.

(ඇ) 2013 වර්ෂයට අදාලව සමාලෝචිත වර්ෂය අවසානයට මගනැගුම කර්මාන්ත 12 ක් සඳහා ලැබිය යුතුව තිබූ එකතුව රු. 3,231,697 ක මුදල සමුච්චිත අරමුදලට බැරකළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ ආදායමට ගෙන තිබුණි.

(ඈ) මගනැගුම කර්මාන්ත දෙකකට අදාලව රු. 1,000,000 ක් ණයහිමියන් වශයෙන් ප්‍රතිපාදන කළ යුතු වුවත් ගිණුම්ගත කර තිබුණේ රු.505,382 ක් පමණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දොරින් දොරට ගමින් ගමට ව්‍යාපෘතිය යටතේ මුදල් ලැබී තිබූ කර්මාන්ත දෙකක් වෙනුවෙන් හා ක්‍රියාත්මක නොවූ කර්මාන්තයක් වෙනුවෙන් ලැබිය යුතු මුදල් කර්මාන්ත ණයගැතියන් වශයෙන් ගිණුම්ගත කර තිබියදීත් නැවතත් රු.4,337,190 ක් ණයගැතියන් ලෙස ප්‍රතිපාදන කිරීම නිසා ප්‍රාග්ධන ආධාර හා ණයගැතියන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ගෙවිය යුතු කර්මාන්ත රැඳවුම් තැන්පතු ලෙස දක්වා ඇති රු. 229,910 ක මුදලක් ණයහිමි වටිනාකමටද ඇතුලත් කර තිබුණි.

(උ) 2014 වර්ෂයේ විමධ්‍යගත ප්‍රතිපාදන යටතේ සිදුකරන ලද කර්මාන්ත 05 ක් සඳහා සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු රු. 108,000 ක මුදලක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඌ) යන්ත්‍රෝපකරණ ව්‍යාපෘතියේ වාහන යොදවා සභාවෙන් සිදු කරන ලද පොදු කටයුතු වෙනුවෙන් ගෙවිය යුතු රු. 5,397,380 ක මුදලක් ගිණුම්ගත කර නොතිබුණි.

(එ) ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු රු. 1,000,000 ක මුදල ගිණුම්ගත කර නොතිබුණි.

(ඒ) 2012 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම වෙනුවෙන් විශ්‍රාමික රජයේ නිලධාරියෙකුට වැඩිපුර ගෙවූ රු.189,700 ක මුදලින් අයවිය යුතු රු. 187,700 ක මුදල ගිණුම් ගත කර නොතිබුණි.

### 1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

පොත්පත්, උපලේඛන හා පැහැදිලි කිරීම් විගණනය වෙත ඉදිරිපත් නොකිරීම නිසා රු. 5,932,866 ක් වූ ගෙවිය යුතු එකතුකළ අගය මත බදු වටිනාකම විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 5,168,404 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 7,780,023 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම් , තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. '000 | රු. '000 | රු. '000 |
| i. | වරිපනම් හා බදු | 1,770 | 979 | 3,493 |
| ii. | බදුකුලී | 17,538 | 17,655 | 2,204 |
| iii. | බලපත්‍ර ගාස්තු | 1,758 | 1,564 | 4 |
| iv. | වෙනත් ආදායම් | 36,233 | 34,161 | 5,772 |

#### 2.2.2 වරිපනම් බදු

සමාලෝචිත වර්ෂය අවසන් දිනට හිඟ වරිපනම් බදු ආදායම වූ රු. 3,445,055 ක් අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 (1) (අ) වගන්තිය ප්‍රකාර කටයුතු කර නොතිබුණි. මෙම හිඟ මුදලින් රු. 5,000 ට වඩා වැඩි ශේෂයන්හි වටිනාකම රු. 824,244 ක් වූ අතර 2002 වර්ෂයේ කරන ලද වරිපනම් තක්සේරුව පදනම් කරගෙන සමාලෝචිත වර්ෂයේදීද වරිපනම් බදු අයකර තිබුණි.

**2.2.3 බදු කුලී**

**--------**

**(අ) කඩකාමර කුලී**

**---------------**

2011 ජනවාරි 01 දිනැති අංක දපපා/පපාකො/2010/01 දරන දකුණු පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 05 උපවගන්තිය අනුව සෑම ගිවිසුමක්ම වසර 03 කට වරක් යාවත්කාලීන කළයුතු වුවත් සභාව සතු පස්මංහන්දිය කඩකාමර හතරක හා පොදු වෙළඳ පල කඩකාමර හතක ගිවිසුම් වසර 25 කට වඩා පැරණි වුවත් එකී ගිවිසුම් යාවත්කාලීන කිරීමට කටයුතු කර නොතිබුණි. චක්‍රලේඛයේ 06 වන වගන්තිය ප්‍රකාරව යටත් පිරිසෙයින් වසර 05 කට වරක්වත් තක්සේරුගත බදු මුදල නව තක්සේරුවක් මගින් සංශෝධනය කළ යුතු බව දන්වා ඇතත් වර්ෂයේ දි අයකර තිබූ කඩකාමර කුලී මුදල සඳහා තක්සේරුවක් ලබාගෙන නොතිබුණි.

**(ආ) පොළ බදු**

**----------**

වර්ෂය අවසානයට හිඟ පොළ බදු මුදල වූ රු. 916,887 ක් අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 (1)(ආ) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**2.2.4 යන්ත්‍රෝපකරණ ආදායම්**

**---------------------------------**

සමාලෝචිත වර්ෂය අවසානයට බාහිර පාර්ශවයන්ගෙන් සහ සභාවේ සභිකයන්ගෙන් රු. 667,424 ක් අයවිය යුතුව තිබුණි.

**2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

**------------------------------**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් උසාවි දඩ හා මුද්දර ගාස්තු වශයෙන් 2014 දෙසැම්බර් 31 දිනට එකතුව රු. 5,772,041 ක මුදලක් ලැබිය යුතුව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලේකම් තනතුරේ රාජකාරි ඉටුකිරීම සඳහා පත්කිරීම

රාජ්‍ය කළමනාකරණ සේවයේ II පන්තියේ නිලධාරිනියක ලේකම් තනතුරේ රාජකාරි ඉටුකිරීම සඳහා පත්කර තිබූ අතර ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ vii වැනි පරිච්ඡේදයේ 12.3 වගන්තියේ සඳහන් විධිවිධාන පටහැනිව දීමනා ගෙවීම නිසා එකතුව රු. 70,000 ක් වැඩිපුර ගෙවා ඇතිබව නිරීක්ෂණය විය.

**(ආ) සේවක ණය**

සභාවේ ලිපිකරු තනතුරක සේවයකල නිලධාරියෙකුට ලබාදෙන ලද ආපදා ණය මුදලින් රු.106,002 ක් වූ ශේෂය, එම නිලධාරියා සේවයෙන් ඉවත් වී දීර්ඝ කාලයක් ගතවී ඇතත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.2 අවිධිමත් ගනුදෙනු

(අ) සභා බල ප්‍රදේශයේ එක් පාසලකට හා ලියාපදිංචි පෙර පාසල්වලට ලබාදීම සඳහා උපකරණ මිලට ගෙන අවස්ථා 3 කදී එකතුව රු. 275,200 ක මුදලක් ගෙවා තිබුණද ඒ සඳහා 1987 ප්‍රාදේශීය සභා පනතේ 132 (ඒ) (ඔ) වගන්ති වලට අනුව අමාත්‍යවරයාගේ ලිඛිත පූර්ව අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ආ) වලස්මුල්ල උපකාර්යාලයට 1992 පෙබරවාරි මාසයේ සිට අනියම් පදනම මත බඳවා ගෙන තිබූ පෙර පාසල් සහායිකාවක් 2007 අගෝස්තු මාසයේ සිට දකුණු පළාත් රාජ්‍ය සේවයේ පෙර පාසල් පාලිකා තනතුරට පත්කර තිබූ අතර මෙම නිලධාරිනියගේ සේවය ස්ථිර කිරීම සඳහා අධ්‍යාපන සහතික සනාථ කර ගැනීමට 2011 ඔක්තෝබර් මාසයේ විභාග කොමසාරිස් ජනරාල් වෙත යවා තිබුණි. 2012 දෙසැම්බර් මාසයේ දී එම විභාග ප්‍රතිඵල විභාග දෙපාර්තමේන්තුවේ ලේඛන හා නොගැලපෙන බව ද ඒවා ව්‍යාජ සහතික බවද විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් සනාථ කර තිබුණි. 2012 දෙසැම්බර් 28 අධ්‍යාපන සහතික නොසැසඳෙන බව විභාග කොමසාරිස්වරයා දැනුම් දී තිබියදීත් 2014 මැයි 07 එම නිලධාරිනියගේ වැඩ තහනම් කරන තෙක් ඇයට වැටුප් හා දීමනා වශයෙන් සභාව විසින් රු.367,312 ක මුදලක් ගෙවා තිබුණි.

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය**

----------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කොන්ක්‍රීට් ගල් සහ ගල්කුඩු ප්‍රවාහනය

------------------------------------------

මහා මාර්ග, වරාය හා නාවික අමාත්‍යාංශ ලේකම්ගේ 2014 ජූලි 02 දිනැති අංක MPH/HYW/MNG/Cer/14 – 1 දරන ලිපියේ උපදෙස් ප්‍රකාරව මග නැගුම ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරනු ලබන මාර්ග සඳහා අමු ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීමේදී අමුද්‍රව්‍ය මත එකතු කරනු ලබන 10% ක අමතර පිරිවැය එකතු නොකර ඇස්තමේන්තු සකස් කරන ලෙස දන්වා තිබුණි. නමුත් 2014 ජූලි 02 දිනෙන් පසුව සභාව විසින් ගිවිසුම් අත්සන් කර ක්‍රියාත්මක කර තිබූ කර්මාන්ත 26 ක් වෙනුවෙන් එසේ කටයුතු නොකිරීම නිසා එකතුව රු. 169,704 ක මුදලක් වැඩිපුර ගෙවීම්කර තිබුණි.

**(ආ) ගල් කුඩු නියමිත ප්‍රමාණයට යොදා නොතිබීම**

------------------------------------------------

මග නැගුම මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කර තිබූ මාර්ග සඳහා මාර්ගවල පතුලට අඟල් 2 ක් ඝනකමට ගල්කුඩු අතුරා ඇති බව දක්වමින් ගෙවීම් වාර්තා සකස් කර ගෙවීම් කර තිබුණි. 2015 මාර්තු 27 දින සිදුකළ භෞතික පරීක්ෂාවේදී කර්මාන්ත හතරක් සඳහා අඟල් 02 ක් ඝනකමට මාර්ගවල පතුලට ගල්කුඩු යොදා නොමැති බවත් ඊට වඩා අඩු ප්‍රමාණයෙන් වූ ගල්කුඩු යොදා තිබූ බවත් නිරීක්ෂණය විය. ඒ අනුව අඟල් 02 ක් ඝනකමට ගල්කුඩු යොදා ඇති බව දක්වමින් ගෙවීම් සිදුකර තිබීම නිසා එකතුව රු. 91,938 ක මුදලක් වැඩිපුර ගෙවීම් කර ඇති බව නිරීක්ෂණය විය.

**(ඇ) කොන්ක්‍රීට් ගැටි නිසිපරිදි ඉදිකර නොතිබීම**

---------------------------------------------

සභාව විසින් ක්‍රියාත්මක කර තිබූ මග නැගුම කර්මාන්ත 03 ක මාර්ග වල දෙපස අඟල් 06 ක් උසට කොන්ක්‍රීට් ගැටි ඉදිකිරීම් වෙනුවෙන් ගෙවීම් කර තිබුණද 2015 මාර්තු 27 දින භෞතික පරීක්ෂාවේදී එසේ කොන්ක්‍රීට් ගැටි ඉදිකර නොතිබූ බව නිරීක්ෂණය වූ අතර ඒ අනුව එකතුව රු. 48,320 ක මුදලක් වැඩිපුර ගෙවීම් කර තිබුණි.

**4.** **පද්ධති හා පාලනය**

**----------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කළයුතුව ඇත.

(අ) ගිණුම්කරණය

(ආ) වත්කම් කළමනාකරණය

(ඇ) ආදායම් පරිපාලනය